# පීඩාවට පත් තැනැත්තන් සඳහා වන්දි පිරිනැමීම.

1. පහත ඡේද 02 හි දක්වා ඇති සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් පීඩාවට පත් තැනැත්තන් එනම් යම්කිසි හානියකින් හෝ අහිමිවීමකින් පීඩාවිඳි තැනැත්තන් පහත උපලේඛන 1 හි දක්වා ඇති යෝජනා ක්‍රම පරිදි වන්දි ලබා ගැනීම සඳහා හිමිකම් කියනු ලැබේ.

2. එම සිදුවීම් පහත පරිදි වේ :

අ**).** උතුරු හා නැගෙනහිර පළාත්වල සිදු වූ වාර්ගික ගැටුම් (**1983** සිට)

ආ). උතුරු නැගෙනහිර සිදු වූ ගැටුම්වලට පරිබාහිරව සිදු වූ පහත සඳහන් මහජන කැළඹීම්වලට අදාල සිදුවීම් **:**

i. බේරුවල ප්‍රදේශයේ සිදු වූ මහජන නොසන්සුන්තාවය (2006 ජනවාරි)

ii. වැලිකඩ බන්ධනාගාරය තුළ සිදු වූ කැරැල්ල (2012 නොවැම්බර්)

iii. බේරුවල හා අලුත්ගම ප්‍රදේශයන්හි දී සිදු වූ මහජන නොසන්සුන්තාවය (2014 ජුනි)

iv. ගිංතොට ප්‍රදේශයේ සිදු වූ මහජන නොසන්සුන්තාවය (2017 නොවැම්බර්)

v. අම්පාර ප්‍රදේශයේ සිදු වූ මහජන නොසන්සුන්තාවය (2018 පෙබරවාරි)

vi. මහනුවර දිස්ත්‍රික්කයේ සිදු වූ මහජන නොසන්සුන්තාවය (2018 මාර්තු)

vii. පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයත් සමඟ ඇති වූ මහජන නොසන්සුන්තාවය (2019 අප්‍රේල්)

viii. පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේ පසුවිපාකයක් ලෙස ඇති වූ මහජන නොසන්සුන්තාවය (2019 මැයි)

**3.** වන්දි ප්‍රදානය කරනු ලබන්නේ:

අ) පීඩාවට පත් තැනැත්තාගේ පවුලේ සාමාජිකයෙකුගේ ජීවිත අහිමි වීමක් වෙනුවෙන්

ආ) ශාරීරික තුවාල හේතුවෙන් පීඩාවට පත් තැනැත්තෙකු වෙනුවෙන්

ඇ) පිඩාවට පත් තැනැත්තාහට අයත්වන ඔහුගේ පෞද්ගලික දේපලවලට සිදු වූ හානිවීමක් හෝ අහිමිවීමක් වෙනුවෙන්

ඈ) ආගමික සිද්ධස්ථානවලට සිදු වූ හානි වෙනුවෙන්

4. පහත කාණ්ඩ යටතේ වන්දි සඳහා හිමිකම් ලබන තැනැත්තන්, සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන සහ වන්දි ලෙස පිරිනැමිය හැකි ප්‍රමාණය උපලේඛන 1 හි 1 - 11 දක්වා කොටස්වල දක්වා ඇත :

## වාර්ගික ගැටුම් :

අ. වාර්ගික ගැටුම් හේතුවෙන් රාජ්‍ය නිළධාරියෙක් මරණයට පත්වීම - **1 කොටස** බලන්න

ආ. වාර්ගික ගැටුම් හේතුවෙන් සාමාන්‍ය පුද්ගලයෙක් මරණයට පත්වීම - **2 කොටස** බලන්න

ඇ. වාර්ගික ගැටුම් හේතුවෙන් රාජ්‍ය නිළධාරියෙකුට සිදු වූ ශාරීරික තුවාල - **3 කොටස** බලන්න

ඈ. වාර්ගික ගැටුම් හේතුවෙන් පොදු මහජනයාගෙන් අයෙක් හට සිදු වූ ශාරීරික තුවාල - **4 කොටස** බලන්න

ඉ. වාර්ගික ගැටුම් හේතුවෙන් රාජ්‍ය නිළධාරියෙකුට අයත් දේපල අහිමි වීමක් හෝ හානිවීමක් - **5 කොටස** බලන්න

ඊ. වාර්ගික ගැටුම් හේතුවෙන් පොදු මහජනයාගෙන් අයෙක්ට අයත් දේපල අහිමි වීමක් හෝ හානි වීමක් - **6 කොටස** බලන්න

උ. වාර්ගික ගැටුම් හේතුවෙන් ආගමික සිද්ධස්ථානවලට සිදු වූ අහිමි වීමක් හෝ හානි වීමක් - **7 කොටස** බලන්න

## උතුරු නැගෙනහිර සිදු වූ වාර්ගික ගැටුම්වලට පරිබාහිරව සිදු වූ මහජන නොසන්සුන්තාවයන් :

අ. මහජන නොසන්සුන්තා සිදුවීම් හේතුවෙන් පොදු මහජනයාගෙන් අයෙක් හට සිදු වූ මරණයක් වෙනුවෙන් - **8 කොටස** බලන්න

ආ. මහජන නොසන්සුන්තා සිදුවීම් හේතුවෙන් සාමාන්‍ය පුද්ගලයෙක් හට සිදු වූ තුවාලයක් වෙනුවෙන් - **9 කොටස** බලන්න

ඇ. මහජන නොසන්සුන්තා සිදුවීම් හේතුවෙන් පෞද්ගලික දේපලවලට සිදු වූ අහිමිවීමක් හෝ හානිවීමක් - **10 කොටස** බලන්න

ඈ. මහජන නොසන්සුන්තා සිදුවීම් හේතුවෙන් ආගමික සිද්ධස්ථානයකට සිදු වූ අහිමිවීමක් හෝ හානිවීමක් - **11 කොටස** බලන්න

5. සෑම කාණ්ඩයකටම අදාලව හිමිකම් ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛනවල සම්පූර්ණ ලැයිස්තුව පහත **උපලේඛන 2** හි දක්වා ඇත.

6. අයදුම්පත් ලබාදීමේ දී හා පිළියෙල කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය පහත **උපලේඛන 3** හි දක්වා ඇත.

# උපලේඛනය 1

## වන්දි යෝජනා ක්‍රම

**1** කොටස

**වාර්ගික ගැටුම් - රාජ්‍ය නිළධාරියෙකුගේ මරණයක්**

| **වන්දි සඳහා හිමිකම් ලැබීමට සුදුසු පුද්ගලයා/ පුද්ගලයන්** | **මරණයක් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන** | **වන්දි ප්‍රමාණය** |
|---|---|---|
| මියගිය රාජ්‍ය නිළධාරියාගේ යැපෙන්නන් | 1) මරණ සහතිකය<br>2) පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව<br>3) ළඟම ඥාතීන්ගේ ඥාතීත්වය තහවුරු කිරීම සඳහා ලේඛන:<br>අ). විවාහ සහතිකය (කලත්‍රයා); හෝ<br>ආ) උප්පැන්න සහතිකය (දරුවන්, සහෝදර සහෝදරියන්, දෙමව්පියන්) | • වන්දි - රු 200,000/-<br>• අවමංගල කටයුතු සඳහා - රු 10,000/- |

**2 කොටස**

**වාර්ගික ගැටුම් - සාමාන්‍ය මහජන පුද්ගලයෙක්ගේ මරණයක්**

| **වන්දි සඳහා හිමිකම් ලැබීමට සුදුසු පුද්ගලයා/ පුද්ගලයන්** | **මරණයක් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන** | **වන්දි ප්‍රමාණය** |
|---|---|---|
| මියගිය තැනැත්තාගේ යැපෙන්නන් | 1) මරණ සහතිකය<br>**2)** පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව<br>3) ළඟම ඥාතීන්ගේ ඥාතීත්වය තහවුරු කිරීම සඳහා ලේඛන:<br>අ) .විවාහ සහතිකය (කලත්‍රයා); හෝ<br>ආ). උප්පැන්න සහතිකය (දරුවන්, සහෝදර සහෝදරියන්, දෙමව්පියන්) | • වන්දි - රු 100,000/-<br>• අවමංගල කටයුතු සඳහා - රු 15,000/- |

## 3 කොටස
## වාර්ගික ගැටුම් - රාජ්‍ය නිළධාරීන්ට සිදු වූ තුවාල වීමක්

| වන්දි සඳහා හිමිකම් ලැබීමට සුදුසු පුද්ගලයා/ පුද්ගලයන් | ශාරීරික තුවාල වීමක් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| තුවාල ලැබූ රාජ්‍ය නිළධාරීන් | තුවාලයේ ස්වභාවය හා හේතුව සහතික කරමින් රජයේ වෛද්‍ය නිළධාරියෙකු විසින් නිකුත් කළ වෛද්‍ය සහතිකය.<br><br>තුවාලය හේතුවෙන් ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය ගණනය කළ සහතිකයක් ඇතුළත් විය යුතුය. | රු. 100,000/= දක්වා |

## කොටස 4
## වාර්ගික ගැටුම් - සාමාන්‍ය මහජනයාගේ සාමාජිකයෙකුට සිදු වූ තුවාල වීමක්

| වන්දි සඳහා හිමිකම් ලැබීමට සුදුසු පුද්ගලයා/ පුද්ගලයන් | ශාරීරික තුවාල වීමක් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| තුවාල ලැබූ තැනැත්තා | තුවාලයේ ස්වභාවය හා හේතුව සහතික කරමින් රජයේ වෛද්‍ය නිළධාරියෙකු විසින් නිකුත් කළ වෛද්‍ය සහතිකය.<br><br>තුවාලය හේතුවෙන් ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය ගණනය කළ සහතිකයක් ඇතුළත් විය යුතුය. | රු. 50,000/= |

## 5 කොටස

## වාර්ගික ගැටුම් - රාජ්‍ය නිළධාරියෙකුට අයත් දේපල අහිමි වීමක් හෝ හානි වීමක්

| වන්දි සඳහා හිමිකම් ලැබීමට සුදුසු පුද්ගලයා/ පුද්ගලයන් | අහිමිවීම හෝ හානිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| දේපල හිමි රාජ්‍ය හා අධිකරණ නිළධාරීන් | ගොඩනැඟිලි සඳහා :<br>හානියේ ස්වභාවය හා වටිනාකම පිළිබඳ පහත නිළධාරීන්ගේ වාර්තාව ද සහිතව ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය -<br>අ. දිස්ත්‍රික් කළමණාකරු, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය; හෝ<br>ආ. දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ (ගොඩනැඟිලි); හෝ<br>ඇ. අනුමත තක්සේරුකරුවෙකු<br>• දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය<br>රථ වාහන සඳහා :<br>හානිය සිදුවන අවස්ථාව වන විට මෝටර් රථයේ වටිනාකම සඳහන් කරමින් පිළිගත හැකි ගරාජයක හිමිකරුවෙකු විසින් ලබා දුන් සහතිකයක්. | රු. 150,000/= දක්වා |

## 6 කොටස

## වාර්ගික ගැටුම් - සාමාන්‍ය මහජන සාමාජිකයෙකුට අයත් දේපල අහිමි වීමක් හෝ හානි වීමක්

| වන්දි සඳහා හිමිකම් ලැබීමට සුදුසු පුද්ගලයා/ පුද්ගලයන් | අහිමිවීම හෝ හානිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| දේපලවල අයිතිකරු | *ගොඩනැඟිලි සඳහා :*<br>හානියේ ස්වභාවය හා වටිනාකම පිළිබඳ පහත නිළධාරීන්ගේ වාර්තාව ද සහිතව ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය -<br>අ. දිස්ත්‍රික් කළමණාකරු, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය; හෝ<br>ආ. දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ (ගොඩනැඟිලි ); හෝ<br>ඇ. අනුමත තක්සේරුකරුවෙකු | උපරිමය රු. 100,000/= නොයික්මවන හානියෙන් 20% ක් |

| | | |
|---|---|---|
| | *රථ වාහන සඳහා :*<br>හානිය සිදුවන අවස්ථාව වන විට මෝටර් රථයේ වටිනාකම සඳහන් කරමින් පිළිගත හැකි ගරාජයක හිමිකරුවෙකු විසින් ලබා දුන් සහතිකයක්.<br><br>*ධීවර ආම්පන්න සඳහා:*<br>අහිමි වීම/ හානිය සිදු වූ අවස්ථාවේ දී අහිමි වූ/ හානියට පත් වූ අයිතමයන් හා ඒවායේ වටිනාකම සඳහන් කරමින් දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිළධාරීවරයා විසින් ලබා දුන් සහතිකය. | |

**7 කොටස**

## වාර්ගික ගැටුම් – ආගමික සිද්ධස්ථානවලට සිදු වූ අහිමි වීම්/ හානි වීම්

| වන්දි හිමිකම් සඳහා සුදුසුකම | අහිමිවීම හෝ හානිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන | වන්දි ප්‍රමාණය |
|---|---|---|
| රජයේ හෝ වෙනත් අදාල ආගමික ව්‍යුහයක ලියාපදිංචි වී ඇති ආගමික සිද්ධස්ථාන | පොලීසියේ සිදු කරන ලද පැමිණිල්ලේ සහතික කළ පිටපතක්; හෝ<br>ත්‍රස්තවාදී කියා හේතුවෙන් අදාල ආගමික සිද්ධස්ථානය විනාශ වූ/ හානි වූ බවට සඳහන් කරමින් පොලීසියෙන් ලබා ගත් වාර්තාවක්. | **විනාශ වීමක් සඳහා -** රු. 1,000,000 (උපරිමය)<br><br>**හානියක් සඳහා -** 25%, 40%, 20%, 15% ආදී වාරික ලෙස ලබා දෙන උපරිමය රු. 500,000/- ක් |

**8 කොටස**

## වාර්ගික ගැටුම්වලට පසුව ඇති වූ මහජන නොසන්සුන්තාවයන් - මරණ

| සිදුවීම | වන්දි හිමිකම් සඳහා සුදුසුකම | මරණය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන | වන්දි ප්‍රමාණය |
|---|---|---|---|
| වැලිකඩ බන්ධනාගාරය, 2012 | මියගිය තැනැත්තාගේ යැපෙන්නන් | 1) මරණ සහතිකය<br>2) පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව<br>3) ළඟම ඥාතීන්ගේ ඥාතීත්වය තහවුරු කිරීම සඳහා ලේඛන:<br>• විවාහ සහතිකය (කලත්‍රයා);<br>• උප්පැන්න සහතිකය (දරුවන්, සහෝදර සහෝදරියන්, දෙමව්පියන්) | රු. 2,000,000/= |
| බේරුවල, අලුත්ගම, 2014 | | | රු. 2,000,000/= |
| ගිංතොට, 2017, අම්පාර, 2018 | | | රු. 500,000/= |
| මහනුවර දිස්ත්‍රික්කය, 2018 | | | රු. 500,000/= |
| පාස්කු ඉරු දින, 2019 | | | රු. 1,000,000/= |
| පශ්චාත් පාස්කු ඉරු දින, 2019 | | | රු. 1,000,000/= |

## 9 කොටස

## වාර්ෂික ගැටුම්වලට පසුව ඇති වූ මහජන නොසන්සුන්තාවයන් – තුවාල

| සිදුවීම | වන්දි හිමිකම් සඳහා සුදුසුකම | තුවාල වීම සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන | වන්දි ප්‍රමාණය |
|---|---|---|---|
| වැලිකඩ බන්ධනාගාරය, 2012 | තුවාල ලැබූ තැනැත්තා | තුවාලයේ ස්වභාවය හා හේතුව සහතික කරමින් රජයේ වෛද්‍ය නිළධාරියෙකු විසින් නිකුත් කළ වෛද්‍ය සහතිකය. | රු. 500,000/= |
| බේරුවල, අලුත්ගම, 2014 | | | රු. 500 ,000/= |
| ගිංතොට, 2017, අම්පාර, 2018 | | | රු. 250,000/= |
| මහනුවර දිස්ත්‍රික්කය, 2018 | | | රු. 250,000/= |
| පාස්කු ඉරු දින, 2019 | | | රු. 500,000/= |
| පශ්චාත් පාස්කු ඉරු දින, 2019 | | | රු. 500,000/= |

## 10 කොටස

## වාර්ෂික ගැටුම්වලට පසුව ඇති වූ මහජන නොසන්සුන්තාවයන් – දේපල අහිමි වීම හෝ හානි වීම

| සිදුවීම | වන්දි හිමිකම් සඳහා සුදුසුකම | අහිමි වීම හෝ හානි වීම සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන | වන්දි ප්‍රමාණය |
|---|---|---|---|
| බේරුවල, 2006 | දේපල හිමිකරු | 1. පොලීසියේ සිදු කරන ලද පැමිණිල්ලේ මුල් පිටපත හෝ සහතික කළ පිටපතක්, හෝ මහජන නොසන්සුන්තාවයක් හේතුවෙන් අදාල දේපල විනාශ වූ/ හානි වූ බවට සඳහන් කරමින් පොලීසියෙන් ලබා ගත් වාර්තාවක්.<br>2. සිදු වූ හානියේ ස්වභාවය හා වටිනාකම සඳහන් කර ඇති තක්සේරු වාර්තාවක් | තොග බඩුවලට සිදු වූ හානි - රු. **500,000/-** තොග. දේපලවලට සිදු වූ හානි - ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තක්සේරුව මත පදනම්ව. |
| බේරුවල, අලුත්ගම, 2014 | | | කලුතර දිස්ත්‍රික් ලේකම්වරයාගේ කමිටුව විසින් නිර්දේශ කරන ලදු ව |
| ගිංතොට, 2017, අම්පාර, 2018 | | | රු. 100,000/= දක්වා |
| මහනුවර දිස්ත්‍රික්කය, 2018 | | | රු. 100,000/= දක්වා<br>*රු. 500,000/= ට වැඩි සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත් කළ කමිටුවේ නිර්දේශය මත ගෙවීම් සිදු කරනු ලැබේ.* |
| පාස්කු ඉරුදින, 2019 | | | රු. 5,000,000/= |
| පශ්චාත් පාස්කු ඉරුදින, 2019 | | | රු. 5,000,000/= |

**11 කොටස**

**වාර්ගික ගැටුම්වලට පසුව ඇති වූ මහජන නොසන්සුන්තාවයන්**
**පූජනීය සිද්ධස්ථානවලට සිදු වූ හානිවීම්**

| සිදුවීම | වන්දි හිමිකම් සඳහා සුදුසුකම | අහිමි වීම හෝ හානි වීම සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන | වන්දි ප්‍රමාණය |
|---|---|---|---|
| ගිංතොට, 2017, අම්පාර, 2018<br>මහනුවර දිස්ත්‍රික්කය, 2018 | පූජනීය ස්ථානයේ දායක සභාව. | 1. පොලීසියේ සිදු කරන ලද පැමිණිල්ලේ මුල් පිටපත හෝ සහතික කළ පිටපතක් හෝ මහජන නොසන්සුන්තාවයක් හේතුවෙන් අදාල දේපල විනාශ වූ/ හානි වූ බවට සඳහන් කරමින් පොලීසියෙන් ලබා ගත් වාර්තාවක්.<br>2. සිදු වූ හානියේ ස්වභාවය හා වටිනාකම සඳහන් කර ඇති තක්සේරු වාර්තාවක්<br>3. | පූර්ණ වශයෙන් හානි වී ඇත්නම් රු. 1,000,000/= ක මුදලක්<br>අර්ධ වශයෙන් හානි වී ඇත්නම් රු. 500,000/= ක මුදලක් |

## උපලේඛනය 2

## වන්දි ලබා ගැනීම සඳහා හිමිකම් ලැබීමට ඉදිරිපත් කළ යුතු ලේඛන

1. **මරණ වන්දි සඳහා හිමිකම්:**

    i. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය
    ii. සිදුවීම පිළිබඳව සිදු කළ පොලිස් පැමිණිල්ලේ මුල් පිටපත
    iii. සාමදාන විනිසුරුවරයෙකු විසින් හෝ ග්‍රාම නිළධාරී විසින් "සත්‍ය පිටපතක්" ලෙස සහතික කළ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
    iv. මරණ සහතිකයේ පිටපතක්
    v. අධිකරණ වෛද්‍ය නිළධාරීගේ වාර්තාව හෝ හදිසි මරණ පිළිබඳ පරීක්ෂකවරයාගේ වාර්තාව
    vi. උරුමකරුවන්ගේ සනාථන (උදා: කලත්‍රයාගේ විවාහ සහතිකය, දරුවන්ගේ උප්පැන්න සහතික)
    vii. බැංකු ගිණුම් විස්තර (ගිණුම් හිමියාගේ නම, බැංකුව හා ශාඛාව, ගිණුම් අංකය)
    viii. රු. 25 ක මුද්දරයක් අලවා එය සාමවිනිසුරුවරයකු ඉදිරිපිටදී අත්සන් කරන ලද පොදු 35 වවුචර් පත

## 2. ශාරීරික හානි සඳහා හිමිකම්

i. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය
ii. සිදුවීම පිළිබඳව සිදු කළ පොලිස් පැමිණිල්ලේ පිටපත
iii. සාමදාන විනිසුරුවරයෙකු විසින් හෝ ග්‍රාම නිළධාරී විසින් "සත්‍ය පිටපතක්" ලෙස සහතික කළ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
iv. තුවාල පිළිබඳ තොරතුරු සඳහන් කර ඇති රජයේ වෛද්‍ය නිළධාරියකු විසින් නිකුත් කළ වෛද්‍ය වාර්තාව
v. බැංකු ගිණුම් විස්තර (ගිණුම් හිමියාගේ නම, බැංකුව හා ශාඛාව, ගිණුම් අංකය)
vi. රු. 25 ක මුද්දරයක් අලවා එය සාමවිනිසුරුවරයකු ඉදිරිපිටදී අත්සන් කරන ලද පොදු 35 වවුචර් පත

## 3. දේපල අහිමි වීම හෝ හානි වීම සඳහා හිමිකම්

i. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය
ii. සිදුවීම පිළිබඳව සිදු කළ පොලිස් පැමිණිල්ලේ පිටපත
iii. සාමදාන විනිසුරුවරයෙකු විසින් හෝ ග්‍රාම නිළධාරී විසින් "සත්‍ය පිටපතක්" ලෙස සහතික කළ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
iv. හිමිකම් ඔප්පුවේ පිටපතක්
v. ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කරන ලද ඔප්පුවේ පිටපතක් සමඟ සිදුවීම සිදුවන අවස්ථාවේ දී දේපලවල අයිතිකරුගේ නම තහවුරු කරමින් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඇති පත්ඉරුවේ අදාල උපුටනයක සහතික කල පිටපතක්
vi. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ඉංජිනේරුවරයා හෝ තක්සේරුකරු විසින් ලබා දුන් හානියේ ඇස්තමේන්තුවක්
vii. බැංකු ගිණුම් විස්තර (ගිණුම් හිමියාගේ නම, බැංකුව හා ශාඛාව, ගිණුම් අංකය)
viii. රු. 25 ක මුද්දරයක් අලවා එය සාමවිනිසුරුවරයකු ඉදිරිපිටදී අත්සන් කරන ලද පොදු 35 වවුචර් පත
ix. රථ වාහනවලට හානි සිදුවීමක දී - හානිය සිදුවන අවස්ථාව වන විට මෝටර් රථයේ වටිනාකම සඳහන් කරමින් පිළිගත හැකි ගරාජයක හිමිකරුවෙකු විසින් ලබා දුන් සහතිකයක්.
x. ධීවර ආම්පන්න සඳහා - අහිමි වීම/ හානිය සිදු වූ අවස්ථාවේ දී අහිමි වූ/ හානියට පත් වූ අයිතමයන් හා ඒවායේ වටිනාකම සඳහන් කරමින් දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිළධාරීවරයා විසින් ලබා දුන් සහතිකය.

**4. අහිමි වූ හෝ හානියට පත් වූ පූජනීය සිද්ධස්ථාන සඳහා වූ හිමිකම්**

i. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය
ii. සිදුවීම පිළිබඳව කරන ලද පොලිස් පැමිණිල්ලේ මුල් පිටපත
iii. පූජනීය සිද්ධස්ථානයේ දායක සභාවේ විස්තර
iv. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් ඉංජිනේරු හෝ තක්සේරුකරු විසින් ලබා දුන් හානියේ ඇස්තමේන්තුව
v. බැංකු ගිණුම් විස්තර
vi. රු. 25 ක මුද්දරයක් අලවා එය සාමවිනිසුරුවරයකු ඉදිරිපිටදී අත්සන් කරන ලද පොදු 35 වවුචර් පත

## උපලේඛනය 3

## අයදුම්පත් ලබා ගැනීමේ දී හා පිළියෙල කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය.

### පියවර 1 : අයදුම්පත ලබා දීම

1. හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් නියම කර ඇති ආකෘති පත්‍රය පරිදි වන්දි ලබා ගැනීම සඳහා අයදුම්පත සකස් කළ යුතුය.

   මෙම ආකෘති පත්‍ර ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාම නිළධාරීන්ගෙන් ලබා ගත හැකි අතර, හානිපූරණය සඳහා වන කාර්යාලයේ වෙබ්අඩවිය වන www.reparations.gov.lk හෝ රාජ්‍ය පරිපාලනය හා සම්බන්ධ අමාත්‍යාංශ වෙබ්අඩවිය වන www.pubad.gov.lk බාගත කරගත හැකි ය.

   රාජ්‍ය නිළධාරීන්හට ඔවුන් ව අනුයුක්ත කර ඇති කාර්යාලයයන්ගෙන් එකී ආකෘති පත්‍ර ලබා ගත හැකිය.

2. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත අනෙකුත් සියලු සනාථන ලේඛන සමඟ ප්‍රදේශයේ ග්‍රාම නිළධාරී වෙත ලබා දිය යුතුය.

### පියවර 2 : ග්‍රාම නිළධාරීවරයාගේ කාර්යභාරය

3. ග්‍රාම නිළධාරී විසින් අයදුම්පතේ ඇති ඔහු/ ඇය විසින් දන්නා යම් යම් ප්‍රකාශ සනාථ කළ යුතුය. එකී ප්‍රකාශයන්හි නිරවද්‍යතාවය පිළිබඳ ව ඔහු/ ඇය සෑහීමට පත් වන්නේ නම්, එම කරුණු තහවුරු කර අයදුම්පත අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කල යුතුය.

4. අයදුම්පත පිළිගත් බව තහවුරු කරමින් ග්‍රාම නිළධාරී විසින් ලිඛිත හා අත්සන් කරන ලද පිළිගත් බවට වන ලියවිල්ලක් අයදුම්කරු වෙත ලබා දෙනු ලැබේ.

### පියවර 3 : ප්‍රාදේශීය ලේකම්වරයාගේ කාර්යභාරය

5. ප්‍රාදේශීය ලේකම්වරයාගේ කාර්යාලය විසින් එසේ ලැබුණු අයදුම්පත හා අනෙකුත් සනාථන ලේඛන නිසි පරිදි ඇත් දැයි පරීක්ෂා කර තහවුරු කරනු ලැබේ.

6. සියලු ලේඛන නිසි පරිදි වේ නම්, එම අයදුම්පත හා සනාථන ලේඛන සියල්ල හානිපූරණය සඳහා වන කාර්යාලයට යොමු කරනු ලැබේ. ආවරණ ලිපියෙහි පිටපතක් අදාල දිස්ත්‍රික් ලේකම්වරයාට හා අයදුම්කරුට යවනු ලැබේ.

7. අයදුම්පත නිසි පරිදි නොවන්නේ නම්, එනම් අයදුම්පතේ යම් කොටසක් නිසි පරිදි සම්පූර්ණ කර නොමැති විට හෝ යම් ලේඛනයක් අමුණා නොමැති විට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් -
   - අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා අයදුම්කරුට උපදෙස් ලබා දීම; හා
   - අයදුම්කරු විසින් අදාල අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අයදුම්පත හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත යවනු ලැබේ.

8. ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කරනු ලදුව, සම්පූර්ණ කරන ලද තම අයදුම්පත අයදුම්කරු විසින් වුව ද හානිපූරණය සඳහා වන කාර්යාලයට ලබා දිය හැකිය.

## පියවර 4 : හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්යභාරය

9. අයදුම්පත ලැබීමෙන් පසුව, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් අයදුම්කරු හට අයදුම්පත ලැබුණු බවට වන ලිපියක් යවනු ලබන අතර, අයදුම්පතෙහි ප්‍රගතිය පිළිබඳව සොයා බැලීමට හානිපූරණය සඳහා වන කාර්යාලයේ සිටින අදාල ක්‍රියාවලිය සඳහා සම්බන්ධ නිළධාරීයකුගේ දුරකථන අංකයක් අයදුම්කරු වෙත ලබා දෙනු ලැබේ.

10. අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර ඇත් දැයි යන්න හා අදාල ලේඛන සියල්ලම විධිමත් පරිදි ඇත් දැයි තහවුරු කර ගැනීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් අයදුම්පත පරීක්ෂා කරනු ලැබේ.

11. අයදුම්පත අසම්පූර්ණ නම් හෝ තවත් යම් සනාථන ලේඛන අවශ්‍ය වන්නේ නම්, ඒවා එවන ලෙස හානිපූරණ කාර්යාලය විසින් අයදුම්කරුට උපදෙස් ලබා දෙනු ලැබේ. අවශ්‍ය ලේඛන ලබා දිය යුතු දිනයක් අයදුම්කරු වෙත ලබා දෙනු ඇත.

12. ලේඛන ලබා ගැනීම සඳහා සහාය අවශ්‍ය වන්නේ නම් එහි දී හානිපූරණය සඳහා වන කාර්යාලයේ නිළධාරියාව සම්බන්ධ කර ගත යුතුය.

13. අයදුම්පත නිසි පරිදි ඇත්නම්, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් අයදුම්කරු වෙත මුදල් ප්‍රදානය කරනු ලැබේ.